රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 අනුව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සිට රාජ්‍ය සේවයේ අනුරූපී තනතුරක් සඳහා ස්ථාන මාරුවීමේදී ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන

| | විස්තරය | ඇත/නැත √ / X |
|---|---|---|
| • | රා.සේ.කො. සභා චක්‍රලේඛ 04/2020 ප්‍රකාරව CS/DOS/TR/PSC/04/2020 අයදුම්පත | |
| • | විධිමත් පත්වීම් ලිපියෙහි සහතික කරන ලද පිටපත | |
| • | සේවය ස්ථිර කිරීමේ ලිපියෙහි සහතික කරන ලද පිටපත. සේවය ස්ථිර කර නොමැති නම් බඳවාගැනීමේ පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ඇතුළත් අධ්‍යාපන සහතිකවල/ උපාධි සහතික/ ඩිප්ලෝමා සහතික සහතික කරන ලද පිටපත්, විස්තරාත්මක ප්‍රතිඵල සටහන් හා වැඩ භාර ගැනීමේ ලිපියේ සහතික කරන ලද පිටපතක් | |
| • | වෙනත් පළාත් රාජ්‍ය සේවයක සිට ස්ථානමාරුවී පැමිණි අයෙක් නම් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියේ සහතික කරන ලද පිටපතක් | |
| • | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ X පරිච්ඡේදය ප්‍රකාරව 10 පරිශිෂ්ඨය | |
| • | නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇති/ආරම්භ කිරීමට සූදානම්ව ඇති / නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානී ගේ සහතිකය (මෙහි විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට සූදානම්ව ඇතැයි යන්නෙන් අදහස් කෙරෙනුයේ සිද්ධියට අදාළ මූලික පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව/ඒ පිළිබඳව නිලධාරයාගෙන් නිදහසට කරුණු විමසා තිබීම යන්න වේ.) | |
| • | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාලය තුළදී තනතුරට අදාළ වන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධරයාට එරෙහිව නොපවතින බවට ආයතන ප්‍රධානී නිර්දේශ සහිත වාර්තාව | |
| • | නිලධරයාට එරෙහිව බරපතල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව විගණන විමසුම් ඇති/නැති බව සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන වාර්තාව | |
| • | ස්ථාන මාරු අයදුම්කරුගෙන් බස්නාහිර පළාත් සභාවට අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳ අදාළ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන වාර්තාව (ස්ථානමාරු අයදුම්කරු WPC/PSC/R/FO/02 ආකෘතියෙහි අදාළ කොටස සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.) | |
| • | ස්ථානමාරු අයදුම් කරන දිනට පූර්වාසන්න වසර 03ක (පවත්නා වර්ෂයද ඇතුළත්ව) වැටුප් රහිත නිවාඩු ඇති/නැති බවට ආයතන ප්‍රධානී නිර්දේශ සහිත වාර්තාව | |
| • | අදාළ නිලධරයා පළාත් සභාවේ වියදමින් විශේෂ පුහුණුවක් ලබා ඇති/නැති බවට හා පුහුණුවට අදාළ ගිවිසුම්ගත අනිවාර්යය සේවා කාලය ඉකුත් වී තිබීම හෝ කිසියම් බැඳුම්කරයකට යටත් කොට තිබී බැඳුම්කරයෙන් නිදහස් වී ඇති/නැති බවට ආයතන ප්‍රධානී සහතිකය | |
| • | ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක් | |
| • | උප්පැන්න සහතිකයෙහි සහතික කරන ලද පිටපතක් | |
| • | නමෙහි වෙනසක් ඇතිනම් දිවුරුම් ප්‍රකාශයක මුල්පිටපත | |
| • | මුල් පත්වීම ලබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද පහත සඳහන් ලියවිලි වල සහතික කරන ලද පිටපත් වෛද්‍ය පරීක්ෂණ වාර්තාව, දිවුරුම/ප්‍රතිඥාව, වත්කම් බැරකම් ප්‍රකාශය, ගිවිසුම | |
| • | යාවත්කාලීන කරන ලද චර්යා සටහනෙහි සහතික කරන ලද පිටපතක් | |
| • | එක් එක් ශ්‍රේණියන්ට උසස් කිරීමේ ලිපිවල සහතික කරන ලද පිටපතක් | |
| • | අදාළ ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල ලේඛණයන්හි සහතික කරන ලද පිටපත | |
| • | අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කරන ලද බවට සනාථ කරන ලිපියෙහි සහතික කරන ලද පිටපතක් | |

| | | |
|---|---|---|
| • | සේවා කාලය තුළ වෙනත් තනතුරු සඳහා තාවකාලිකව මුදාහැරීම් සම්බන්ධ ලිපිවල සහතික කරන ලද පිටපතක් | |
| • | සේවා කාලය තුළ ලබා ගෙන ඇති විදේශ නිවාඩු පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපිවල සහතික කරන ලද පිටපතක් | |
| • | දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට, අදාළ තනතුරේ නියමිත ශ්‍රේණියෙහි ජ්‍යෙෂ්ඨත්වයෙන් අගට සිටීමට, පුරප්පාඩු සහිත ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට කැමැත්ත ප්‍රකාශිත දිවුරුම් ප්‍රකාශයක මුල් පිටපත සහ එහි ඡායා පිටපතක් | |